AL/2024/48/STE-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය I
கிரேக்க, உரோம நாகரிகம் I
Greek and Roman Civilization I

48 STE I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය / சுட்டெண் / Index No ..................................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.
பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும்.
**For Examiner's use only.**

| ප්‍රශ්න අංක<br>வினா இல.<br>Question No. | ලකුණු<br>புள்ளிகள்<br>Marks |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව<br>மொத்தம்<br>Total | |

| | අත්සන<br>கையொப்பம்<br>Signature | සංකේත අංකය<br>குறியீட்டு எண்<br>Code Number |
|---|---|---|
| පළමු පරීක්ෂක<br>முதலாவது பரீட்சகர்<br>First Examiner | | |
| දෙවන පරීක්ෂක<br>இரண்டாவது பரீட்சகர்<br>Second Examiner | | |
| අතිරේක / ප්‍රධාන පරීක්ෂක<br>மேலதிக / பிரதான பரீட்சகர்<br>Additional/Chief Examiner | | |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක<br>மதிப்பீட்டுப் புள்ளிகளை உறுதிப்படுத்தும் பரிசோதகர்<br>Evaluation Marks Finalizer | | |
| ප්‍රධාන පරීක්ෂක<br>பிரதான பரீட்சகர்<br>Chief Examiner | | |



06060000188110896

**(48) ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය I**

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- **I** කොටසෙහි **1** සිට **30** දක්වා ඇති ප්‍රශ්නවලට **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.
- **II** කොටසෙහි **31** සිට **50** දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු දී ඇති තිත් ඉර මත ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු **එක් භාෂාවකින්** පමණක් සැපයිය යුතුයි.

## I කොටස - ග්‍රීක හා රෝම ඉතිහාසය

**1.** ස්පාර්ටානු සනාතන සභාව හැඳින් වූ නම සහ එහි සංයුතිය පිළිබඳව සඳහන් වන්නේ පහත කුමන වරණයේ ද?
(1) වැඩිහිටි ස්පාර්ටන්වරුන්ගෙන් සමන්විත වූ ගෙරූසියාව
(2) වයස අවුරුදු හැට ඉක්මවූවන්ගෙන් සමන්විත වූ අපෙල්ලා සභාව
(3) වැඩිහිටියන්ගෙන් සහ රජවරු දෙදෙනෙකුගෙන් සමන්විත වූ ගෙරූසියාව
(4) වැඩිහිටියන් සහ පුරවැසියන්ගෙන් සමන්විත වූ එෆොර් සභාව
(5) රජවරුන්, වැඩිහිටියන් සහ පුරවැසියන්ගෙන් සමන්විත වූ අපෙල්ලා සභාව (......)

**2.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ලයිකර්ගස් හඳුන්වා දුන් නීති සම්පාදනයේ ප්‍රතිඵලයක් **නොවන්නේ** කුමක් ද?
(1) ස්පාර්ටන්වරු වෘත්තීය සොල්දාදුවන් බවට පත් වූහ.
(2) ස්පාර්ටන්වරු අහංකාර වූ අතර මසුරුකමේ ගොදුරු බවට පත් වූහ.
(3) ස්පාර්ටාව හමුදා රාජ්‍යයක් බවට පත් විය.
(4) ස්පාර්ටාව පෙලොපොනේසියාවේ ප්‍රමුඛ බලය බවට පත් විය.
(5) ඇතන්ස් රාජ්‍යය ස්පාර්ටාවේ ඊර්ෂ්‍යාවට ලක් විය. (......)

**3.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් කුරිරු පාලකයන්ගේ නැගීමට තුඩු දුන් හේතු සේ දැක්විය හැකි ප්‍රකාශ දෙක මොනවා ද?
A - රදළ පවුල් එම කාලයේ දී අතෘප්තිමත්ව සිටීම
B - කතිපයාධිකාරීන්ගේ (Oligarchies) පීඩාකාරී පාලනය
C - රාජාණ්ඩු ක්‍රමය අහෝසි කිරීම
D - ප්‍රජාතන්ත්‍රවාදයේ බිඳ වැටීම
E - ජනරජ ආණ්ඩුවේ සාර්ථකත්වය
(1) A සහ B (2) A සහ E (3) B සහ C (4) C සහ D (5) D සහ E (......)

**4.** සොලොන්ගේ නීති ඩ්‍රැකෝගේ නීතිවලින් වෙනස් වූයේ පහත සඳහන් ලක්ෂණ අතුරෙන් කුමන ලක්ෂණ දෙක පදනම් කර ගෙන ද?
A - නීතිවල දරුණුකම
B - ජනතාවගේ සුභසාධනය වැඩිදියුණු කිරීම
C - ධනවතුන්ට පීඩාකාරී වීම
D - වංශවතුන්ට වාසි සහගත වීම
E - දුප්පතුන්ට ඡන්ද අයිතිය ලැබීම
(1) A සහ B (2) A සහ E (3) B සහ C (4) C සහ D (5) D සහ E (......)

**5.** ඇතීනියානුවන් මැරතන් සටන ජයග්‍රහණය කිරීමේ ප්‍රතිඵල ලෙසින් දැක්විය හැක්කේ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කවර ප්‍රකාශ දෙක ද?
A - ග්‍රීසියේ ඒකාධිපතිවාදය ප්‍රචලිත වීම
B - ලියොනිඩාස්ගේ වෘත්තිය ප්‍රවර්ධනය වීම
C - ග්‍රීසිය පර්සියානු පළාතක් වීම වැළැක්වීම
D - ග්‍රීකයන්ගේ ආත්ම විශ්වාසය වැඩි දියුණු වීම
E - ඩෝරියන්වරු ගරුත්වයට පාත්‍ර වීම
(1) A සහ B (2) A සහ E (3) B සහ C (4) C සහ D (5) D සහ E (......)

[3 වැනි පිටුව බලන්න/பக். 3 ஐப் பார்க்க/See page three

0001319

000896

6. ග්‍රීසිය සහ පර්සියාව සටන් වැදුණු සලමිස් සංග්‍රාමය පිළිබඳව නිවැරදි වන්නේ මින් කුමන වර්ෂය ද?
(1) ක්‍රි.පූ. 492 (2) ක්‍රි.පූ. 490 (3) ක්‍රි.පූ. 480 (4) ක්‍රි.පූ. 479 (5) ක්‍රි.පූ. 461 (......)

7. පර්සියානු යුද්ධය අවසාන කරමින් ආසියාතික ග්‍රීකයන්ට පර්සියානු පාලනයෙන් නිදහස ලැබුණේ පහත සඳහන් කුමන සටනින් පසුව ද?
(1) තෙර්මොපිලායි හි සටන
(2) සලාමිස් සටන
(3) ප්ලැටියා සටන
(4) මයිකාලේ හි සටන
(5) කොරොනෙයා හි සටන (......)

8. ඩෙලෝස් සම්මේලනය ඇතීනියානු අධිරාජ්‍යයක් බවට පරිවර්තනය වූ අකාරය නිරූපණය කරන නිවැරදි සිදුවීම් අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර තෝරන්න.
A - නැක්සොස්, තේසොස් සහ කරිස්තුස් රාජ්‍යයන් බලෙන් සම්මේලනයට සම්බන්ධ කර ගන්නා ලදී.
B - භාණ්ඩාගාරය ඩෙලෝස් සිට ඇතන්ස් වෙත මාරු කරන ලදී.
C - මිත්‍ර නාවුක බලඇණිය ඇතන්ස් රාජ්‍යයේ පාලනයට ගන්නා ලදී.
D - සම්මේලනයේ මුදල් ඇතන්ස් රාජ්‍යයේ තනි භාවිතයට ගන්නා ලදී.
E - මිත්‍ර සාමාජිකයින් ඇතන්ස් රාජ්‍යයේ නිෂ්ක්‍රීය බදු ගෙවන්නන් බවට පත් කර ගන්නා ලදී.
(1) A, C, D, B, E (2) A, C, E, B, D (3) A, E, B, D, C (4) C, A, B, D, E (5) E, A, B, C, D (......)

9. පෙරික්ලීස්ගේ ප්‍රතිසංස්කරණයන් සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) සියලු පන්තිවලට ආර්කන් පදවිය විවෘත කරන ලදී.
(2) ජනතාවගේ ව්‍යවස්ථාමය බලය අඩු කරන ලදී.
(3) ජූරි සේවය සඳහා ගෙවීම් හඳුන්වා දෙන ලදී.
(4) ඇරියොපේගස් උසාවියේ බලය සීමා කරන ලදී.
(5) ඡන්දයෙන් තෝරා පත් කරගැනීම දියුණු කරන ලදී. (......)

10. පහත සඳහන් කරුණු අතුරෙන් පෙලොපොනීසියානු යුද්ධයේ ආසන්නතම හේතුව වන්නේ කුමක් ද?
(1) ඇතීනියානු වරායවලින් සහ වෙළඳපොළින් බැහැර කිරීම නිසා මෙගාරියන්වරුන්ගේ කෝපය
(2) ඇතන්ස් රාජ්‍යය තම ස්වාධීනත්වය අහිමි කිරීම නිසා මිත්‍ර පාක්ෂිකයින්ගේ අතෘප්තිය
(3) ඇතන්ස්හි වාණිජ සමෘද්ධිය ගැන කොරින්තියන්වරුන් දැක් වූ ඊර්ෂ්‍යාව
(4) ඇතන්ස් සතු වූ සමුද්‍ර අධිරාජ්‍යය පිළිබඳ ස්පාර්ටාව ඇඩි ඊර්ෂ්‍යාවෙන් යුතු වීම
(5) කෝසයිරාවට උදව් කිරීමෙන් ඇතන්ස් කෙරෙහි පැවති කොරින්ත් රාජ්‍යයේ ද්වේශය (......)

11. දසාණ්ඩුව (Decharchy) පිළිබඳ නිවැරදි නිර්වචනය තෝරන්න.
(1) ආණ්ඩුකාරවරුන් දස දෙනෙකුගෙන් යුත් ප්‍රජාතන්ත්‍රවාදී රජය
(2) රජකෙනෙකු විසින් මෙහෙයවන ලද අධිරාජ්‍යවාදී ආණ්ඩුව
(3) දස දෙනෙකුගෙන් යුත් ජූරි සභාව
(4) ස්පාර්ටන් හමුදාවක් මගින් පාලනය වන කතිපයාධිකාරී (Oligarchical government) රජය
(5) වැඩිමහල්ලන් දස දෙනෙකුගෙන් යුත් සභාව (......)

12. ක්‍රි.පූ. 371 දී ස්පාර්ටන් බලය බිඳ දැමුවේ කවුරුන් විසින් කුමන සටනේ දී ද?
(1) ලියුක්ට්‍රා සටනේ දී එපමිනොන්ඩාස් විසිනි.
(2) කොරින්තියන්වරුන්ට එරෙහිව පෙරික්ලීස් දියත් කළ සටනේ දී
(3) නැක්සෝස් සටනේ දී ඇතීනියානුවන් විසිනි.
(4) ටෙගිරාහි සටනේ දී තිබන්වරුන් විසිනි.
(5) කැඩ්මියා සටනේ දී කැලියාස් විසිනි. (......)

13. ක්‍රි.පූ. 371 දී ස්පාර්ටන් බලය බිඳ දැමූ පසු, නව නගරයක් (Megalopolis) සහ ෆෙඩරල් හමුදාවක් සහිතව පිහිටුවන ලද සම්මේලනය මින් කුමක් ද?
(1) ස්පාර්ටන් සම්මේලනය
(2) ආර්කේඩියානු සම්මේලනය
(3) ඒජියානු සම්මේලනය
(4) එටෝලියානු සම්මේලනය
(5) බියෝෂියානු සම්මේලනය (......)

05060000188110896

**14.** සිය බලය ආරම්භයේ දී මැසිඩෝනියාවේ ෆිලිප් විසින් රාජ්‍ය තාන්ත්‍රිකව අල්ලා ගනු ලැබුවේ පහත සඳහන් කුමන නගරය ද? (ත්‍රේස් වෙත පිවිසුම් දොරටුව ලෙස සලකනු ලැබූ)
(1) ඇම්ෆිපොලිස්
(2) පිඩ්නා
(3) පිලිප්පි
(4) මැසිඩෝනියාව
(5) තීබ්ස් (……)

**15.** ක්‍රි.පූ. 338 දී සිදු වූ කයෙරෝනියා සටනේ ප්‍රතිඵල සඳහන් වන්නේ පහත දක්වා ඇති කවර ප්‍රකාශ දෙකේ ද?
A - බියෝෂියානු සම්මේලනය විසුරුවා හරින ලදී.
B - ජනරාල්වරයා ලෙස ෆිලිප් පර්සියාවට ප්‍රහාරයක් එල්ල කරන ලදී.
C - ඇතන්ස් රාජ්‍යය කෙරෙහි දරුණුව කටයුතු කරන ලදී.
D - තීබ්ස් රාජ්‍යයට වහල්භාවයෙන් නිදහස්වීමට ඉඩ හරින ලදී.
E - මැසිඩෝනියාව ග්‍රීසියේ පූර්ණ බලාධිකාරිය බවට පත් කරන ලදී.
(1) A සහ B (2) A සහ E (3) B සහ C (4) C සහ D (5) D සහ E (……)

**16.** **පළමු තීරුවේ** දැක්වෙන රජවරුන්ගේ නමට අනුව **දෙවන තීරුවේ** දැක්වෙන ඔවුන්ගේ දායකත්වය ගළපමින් එය අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

| පළමු තීරුව | දෙවන තීරුව |
|---|---|
| රොමියුලස් | A - රෝමය ලැටිනියානු සභාවේ ප්‍රධානියා කරවන ලදී. |
| නූමා පොම්පීලියස් | B - දින දර්ශනය ප්‍රතිසංස්කරණය කර කෘෂිකර්මාන්තය දියුණු කරවන ලදී. |
| ඇන්කස් මාර්කියස් | C - යුද ජයග්‍රහණ කෙරෙහි අවධානය යොමු කිරීම සහ යුද්ධය හරහා රෝම භූමිය පුළුල් කරන ලදී. |
| ටාර්කුවිනියස් සුපර්බස් | D - ටයිබර් ගංගාව හරහා ප්‍රථම පාලම ඉදි කරන ලදී. |
| | E - ජනගහනය ප්ලෙබියන්වරුන් සහ පැට්‍රිෂියන්වරුන් ලෙස වෙන් කරන ලදී. |

(1) A, B, C, D (2) B, C, A, E (3) C, E, B, D (4) D, A, C, B (5) E, B, D, A (……)

**17.** පුරාණ රෝමයේ රාජාණ්ඩුව අහෝසි කිරීමෙන් පසුව පරම බලය පැවරුණේ,
(1) සෙන්සර්වරුන් විසින් අවුරුද්දක් පාසා පත් කරන කොන්සල්වරුන් දෙදෙනෙකුට ය.
(2) සෙන්සර්වරුන් විසින් අවුරුද්දක් පාසා පත් කරන ප්‍රයටර්වරුන් දෙදෙනෙකුට ය.
(3) මහජනයා විසින් අවුරුද්දක් පාසා තෝරා ගන්නා කොන්සල්වරුන් දෙදෙනෙකුට ය.
(4) මහජනයා විසින් අවුරුද්දක් පාසා තෝරා ගන්නා එෆෝන්වරුන් පස්දෙනෙකුට ය.
(5) මහජනයා විසින් අවුරුද්දක් පාසා තෝරා ගන්නා ආර්කන්වරුන් හය දෙනෙකුට ය. (……)

**18.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ක්‍රි.පූ. තුන් වන සියවසේ පැන වූ රෝම නිලධාරි පදවි පිළිබඳව නිවැරදි වන්නේ කුමන ප්‍රකාශ දෙක ද?
A - සිවිල් සහ හමුදා කටයුතු දෙකෙහි දී ම ඉහළ ම විධායක නිලධාරීන් වූයේ කොන්සල්වරුන් ය.
B - කොන්සල්වරුන් ජීවිතාන්තය පුරාවට ම බලතල දැරූහ.
C - මුලින් ම ප්‍රයටර්වරුන් තිදෙනෙකු පත් කරන ලදී.
D - සෑම අවුරුදු පහකට වරක් ම සෙන්සර්වරුන් දෙදෙනෙකු තෝරා ගන්නා ලදී.
(1) A සහ B (2) A සහ C (3) A සහ D (4) B සහ C (5) C සහ D (……)

- පියුනික් යුද්ධ පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ කියවා ප්‍රශ්න අංක **19** සිට **21** දක්වා පිළිතුරු සපයන්න.
A - කාර්තජීනියානු හමුදාවේ ප්‍රධානියා වූයේ හැමිල්කා බාර්කා ය.
B - එරික්ස් රාජ්‍යය අල්ලාගෙන වසර දෙකක් රඳවා තබා ගන්නා ලදී.
C - සැගුන්ටුම් වෙත ප්‍රහාර එල්ල කිරීම
D - කාර්තජීනියානු හමුදාවේ ප්‍රධානියා වූයේ හැනිබාල් ය.
E - මසිනිස්සා කාර්තජීනියානු භූමියට පහරදීම

**19.** පියුනික් යුද්ධවල පළමු කාල පරිච්ඡේදයේ වූ සිදුවීම් පිළිබඳව සඳහන් වන්නේ ඉහත දැක්වෙන කුමන ප්‍රකාශ දෙකේ ද?
(1) A සහ B (2) A සහ C (3) B සහ E (4) C සහ D (5) D සහ E (……)

[5 වැනි පිටුව බලන්න/பக். 5 ஐப் பார்க்க/See page five

**20.** පියුනික් යුද්ධවල දෙවන කාල පරිච්ඡේදයේ වූ සිදුවීම් පිළිබඳව සඳහන් වන්නේ ඉහත දැක්වෙන කුමන ප්‍රකාශ දෙකේ ද?
(1) A සහ B (2) A සහ C (3) B සහ E (4) C සහ D (5) D සහ E (……)

**21.** පියුනික් යුද්ධවල තුන්වන කාල පරිච්ඡේදයේ වූ සිදුවීමක් පිළිබඳව සඳහන් වන්නේ ඉහත දැක්වෙන කුමන ප්‍රකාශයේ ද?
(1) A (2) B (3) C (4) D (5) E (……)

000896

**22.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් හැනිබාල්ගේ අසාර්ථකත්වයට තුඩු දුන් හේතු සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) රෝමවරුන්ගේ දැඩි උත්සාහය
(2) ලතින් ජාතිකයන් රෝමයට විශ්වාසවන්තව සිටීම
(3) මෙටවුරස්හි දී හස්ඩ්‍රබාල් පරාජය වීම
(4) කාර්තජීනියානු රජයෙන් ප්‍රමාණවත් සහයෝගයක් නොලැබීම
(5) යුද්ධය පවතින අතරතුර දී හැනිබාල්ව නඩු කටයුත්තක් සඳහා මව්බිමට කැඳවනු ලැබීම (……)

- පහත දැක්වෙන ප්‍රකාශ කියවා ප්‍රශ්න අංක **23** සිට **24** දක්වා පිළිතුරු සපයන්න.

A - කුඩා ඉඩම් හිමියන්ට ඉඩම් අහිමිවීම
B - වෙනස්කම් සහිතව ලිසීනියානු නීති නැවත බලාත්මක කිරීම
C - ග්‍රාමීය ජනගහනය අඩුවීම
D - මිනිසුන්ට තම ඉඩම විකිණීමට හෝ අතහැර දැමීමට අවසර නොමැතිවීම

**23.** ටයිබීරියස් ග්‍රැකස්ට තම ප්‍රතිසංස්කරණයන් ගෙන ඒමට ඉඩදෙමින් ඉතාලියේ පැවති තත්ත්වය පිළිබඳව සඳහන් වන්නේ ඉහත කුමන ප්‍රකාශ දෙකේ ද?
(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D (5) C සහ D (……)

**24.** ටයිබීරියස් ග්‍රැකස්ගේ ප්‍රතිසංස්කරණයන් පිළිබඳව සඳහන් වන්නේ ඉහත කුමන ප්‍රකාශ දෙකේ ද?
(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D (5) C සහ D (……)

**25.** තම ක්වයස්ටර්වරයාගේ සහයෝගයෙන් පිටපිටම ඉක්මනින් ජුගුර්තාගේ බලකොටු අඩුකළේ මින් කුමන රෝම නායකයා ද?
(1) ක්‍රැසස් (2) ජුලියස් සීසර් (3) පොම්පේ (4) මේරියස් (5) සුල්ලා (……)

**26.** පහත ප්‍රකාශ අතුරෙන් මිත්‍රිඩාටස් සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශයක් වන්නේ කුමක් ද?
(1) බිතීනියාව සහ කැප්පඩෝකියාව ආක්‍රමණය කිරීම
(2) ෆ්‍රිජියාව සහ ගැලේටියාව අල්ලා ගැනීම
(3) රෝම ජෙනරාල් ඇක්විලියාස් අල්ලා ගැනීම
(4) සියලු ආසියානු නගරවල සිටින රෝමවරු සහ ඉතාලියානුවන් මරා දැමීමට නියෝග කිරීම
(5) බටහිර විමුක්තිදායකයා ලෙස හැඳින්වීමට පාත්‍ර වීම (……)

- පහත දැක්නෙ ප්‍රකාශ කියවා අංක **27** සිට **30** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රෝම රජයට එරෙහිව කුමන්ත්‍රණය කරන ලදී.
B - වෙරෙස්ට එරෙහිව ගෙනා දෝෂාභියෝගය නිසා ප්‍රසිද්ධියට පත් විය.
C - පියුනික් යුද්ධවල දී රෝමය වෙනුවෙන් සටන් කරන ලදී.
D - පළමු ත්‍රයම් විරේටයේ සාමාජිකයකු විය.
E - ක්‍රි. පූ. 147 දී කොන්සල්වරයකු සේ පත් විය.

**27.** ක්‍රැසස් පිළිබඳව සඳහන් වන්නේ ඉහත කුමන ප්‍රකාශයේ ද?
(1) A (2) B (3) C (4) D (5) E (……)

**28.** කුඩා සිපියෝ ඇෆ්‍රිකානුස් පිළිබඳව සඳහන් වන්නේ ඉහත කුමන ප්‍රකාශ දෙකේ ද?
(1) A සහ B (2) B සහ C (3) C සහ D (4) C සහ E (5) D සහ E (……)

**29.** සිසරෝ පිළිබඳව සඳහන් වන්නේ ඉහත කුමන ප්‍රකාශයේ ද?
(1) A (2) B (3) C (4) D (5) E (……)

**30.** කැටිලීනා පිළිබඳව සඳහන් වන්නේ ඉහත කුමන ප්‍රකාශයේ ද?
(1) A (2) B (3) C (4) D (5) E (……)

04060000188110896

## II කොටස - ග්‍රීක හා රෝම සාහිත්‍යය

- කෙටි පිළිතුරු සපයන්න.

**31.** හිසියඩ්ගේ **වැඩපළ සහ දින නිමිති** (Works and Days) කෘතියට අනුව,

(i) කාව්‍යය ආරම්භයේ දී කැඳවනුයේ කුමන දෙවිවරුන් ද?

........................................................................................................

(ii) ඒ කුමක් කිරීමට ද?

........................................................................................................

**32.** හිසියඩ්ගේ **වැඩපළ සහ දින නිමිති** (Works and Days) කෘතියට අනුව හිසියඩ් තම කාව්‍යය ආරම්භයේ දී සහෝදරයා වන පර්සියස්ට දෙන උපදෙස කුමක් ද?

........................................................................................................

........................................................................................................

**33.** හිසියඩ්ගේ **වැඩපළ සහ දින නිමිති** (Works and Days) කෘතියට අනුව එපිමේතියස්, තමාට තෑග්ගක් ලෙස සියුස් එවූ පැන්ඩෝරාව පිළිගැනීමට පෙර මිනිසුන් පෘථිවියේ ජීවත්වූයේ කෙසේ ද?

........................................................................................................

........................................................................................................

**34.** ඇරිස්ටොෆනීස්ගේ **බඹරු** (Wasps) නාට්‍යයේ පළමු ජවනිකාවේ එන පළමු දර්ශනයේ, ප්‍රොක්ලියොන් ඇන්ටික්ලියොන්ගෙන් කුමක් ඔප්පු කරන ලෙස ඉල්ලා සිටියේ ද?

........................................................................................................

........................................................................................................

**35.** ඇරිස්ටොෆනීස්ගේ **බඹරු** (Wasps) නාට්‍යයේ පළමු ජවනිකාවේ එන දෙවන දර්ශනයේ, ප්‍රොක්ලියොන් ජූරි සභාවේ සේවයෙන් වැළකී සිටීම දැඩි ලෙස ප්‍රතික්ෂේප කරන විට ඇන්ටික්ලියොන් යෝජනා කරන්නේ කුමන පිළියම ද?

........................................................................................................

........................................................................................................

**36.** ඇරිස්ටොෆනීස්ගේ **බඹරු** (Wasps) නාට්‍යයේ දැක්වෙන ව්‍යාජ නඩු විභාගයේ දී විත්තිකරු වරදකරු බවට පත් කරන ප්‍රොක්ලියොන්ගේ සාමාන්‍ය පුරුද්දෙන් ඔහුව බැහැර කරවමින්, ප්‍රොක්ලියොන්ට අනුව, ඔහුගේ මනස වෙනස් කිරීමට වගකිව යුතු වන දෙය කුමක් ද?

........................................................................................................

........................................................................................................

**37.** සොෆොක්ලීස්ගේ **ෆිලොක්ටිටීස්** (Philoctetes) නාට්‍යයේ, ෆිලොක්ටිටීස්ගේ විශ්වාසය දිනා ගැනීමට ඔඩීසියස් නෙයොප්ටොලෙමස්ට උපදෙස් දුන්නේ කෙසේ ද?

........................................................................................................

........................................................................................................

**38.** සොෆොක්ලීස්ගේ **ෆිලොක්ටිටීස්** (Philoctetes) නාට්‍යයේ,

(i) ෆිලොක්ටිටීස්ගේ ආයුධය ගැන ඔඩීසියස් නෙයොප්ටොලෙමස්ට පවසන්නේ කුමක් ද?

........................................................................................................

(ii) නෙයොප්ටොලෙමස් සහ ඔඩීසියස් එම ආයුධය සම්බන්ධයෙන් කුමක් කළ යුතු ද?

........................................................................................................

[7 වැනි පිටුව බලන්න/பக். 7 ஐப் பார்க்க/See page seven

000896

**39.** සොෆොක්ලීස්ගේ **ෆිලොක්ටිටීස්** (Philoctetes) නාට්‍යයේ,

(i) ෆිලොක්ටිටීස්ව රැවටීමට ඔඩිසියස්ට උපකාර කිරීම සඳහා නෙයොප්ටොලෙමස් මුලින් එකඟ නොවන්නේ ඇයි?

..............................................................................................................................

(ii) ඒ වෙනුවට නෙයොප්ටොලෙමස් යෝජනා කළේ කුමක් ද?

..............................................................................................................................

**40.** සොෆොක්ලීස්ගේ **ෆිලොක්ටිටීස්** (Philoctetes) නාට්‍යයේ ඔඩිසියස්ට අනුව, නෙයොප්ටොලෙමස් පැවරුන මෙහෙයුම ඉටු කළ විට ඔහුට (නෙයොප්ටොලෙමස්ට) ලැබීමට නියමිත ත්‍යාග **දෙක** මොනවා ද?

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................

**41.** යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** (Alcestis) නාට්‍යයේ, මෙහෙකාර සේවිකාව පවසන පරිදි ඇල්සෙස්ටිස් රැජිණ තම සැමියා වන ඇඩ්මීටස් රජුගේ ජීවිතය ගළවා ගැනීම සඳහා ස්වේච්ඡාවෙන් මිය යාමට ඉදිරිපත් වුවත් ඇයව පීඩාවට පත් කළ හේතු මොනවා ද?

..............................................................................................................................

..............................................................................................................................

**42.** යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** (Alcestis) නාට්‍යයේ, ඇල්සෙස්ටිස් මියැදීමට මොහොතකට පෙර අවසාන වශයෙන් ඇඩ්මීටස්ගෙන් ඉල්ලා සිටියේ කුමක් ද?

..............................................................................................................................

..............................................................................................................................

**43.** ටෙරන්ස්ගේ **නැන්දම්මාවරු** (Mothers-in-law) නාට්‍යයේ මහලු ගණිකාව (සිරා) තරුණ ගණිකාවට (ෆිලෝටිස්) ලබාදෙන උපදෙස කුමක් ද?

..............................................................................................................................

..............................................................................................................................

**44.** ටෙරන්ස්ගේ **නැන්දම්මාවරු** (Mothers-in-law) නාට්‍යයේ බැකිස්, මිරිනා සහ ෆිලුමිනා බැහැ දැකීමට පැමිණියේ කුමන ක්ෂණික චේතනාවකින් ද?

..............................................................................................................................

..............................................................................................................................

**45.** ඇපොලෝනියස්ගේ **ද වොයෙජ් ඔෆ් ආර්ගෝ** (The Voyage of Argo) කාව්‍යයේ, මෙහෙයුම ඉටුකිරීම පිණිස යාත්‍රා කිරීමට පෙර,

(i) කාර්ය මණ්ඩලය අමතා නැවේ සිටින හොඳම මිනිසා ඔවුන්ගේ නායකයා ලෙස තෝරාගන්නා මෙන් ඉල්ලා සිටියේ කවුද?

..............................................................................................................................

(ii) කාර්ය මණ්ඩලය ඒකමතිකව තෝරාගත්තේ කවුද?

..............................................................................................................................

**46.** ඇපොලෝනියස්ගේ **ද වොයෙජ් ඔෆ් ආර්ගෝ** (The Voyage of Argo) කාව්‍යයේ, ෆීනියාස්ගේ අනාවැකියට අනුව,

(i) ආර්ගොනෝට්වරුන්ට ෆීනියාස් හැර ගිය පසු මුහුණදීමට නියමිත වූ පළමු අභියෝගය කුමක් ද?

..............................................................................................................................

(ii) එම අභියෝගයට සාර්ථකව මුහුණ දීමට ෆීනියාස් දෙන උපදෙස් මොනවා ද?

..............................................................................................................................

0306000188110896

**47.** ඇපොලෝනියස්ගේ **ද වොයෙජ් ඔෆ් ආර්ගෝ** (The Voyage of Argo) කාව්‍යයේ ඊටිස්ගේ එක් දියණියක් ජේසන් හා ආදරයෙන් බැඳවීමට ඇෆ්රොඩයිට් සහ ඊරොස්ගේ උපකාර පැතූ දෙවඟනන් **දෙදෙනා** කවුරුන්ද?

(i) ..........................................................................................

(ii) ..........................................................................................

**48.** ඇපොලෝනියස්ගේ **ද වොයෙජ් ඔෆ් ආර්ගෝ** (The Voyage of Argo) කාව්‍යයේ දැක්වෙන කොල්කියානු රජු වන ඊටිස්ගේ දියණියන් **දෙදෙනා** නම් කරන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

**49.** සිසරෝගේ **මහලු විය** (On Old Age) කෘතියේ සඳහන් පරිදි, මහලු වියට එරෙහිව නැගෙන පළමුවන සහ තුන්වන චෝදනා/අභියෝග මොනවාද?

(i) පළමුවන චෝදනාව/අභියෝගය : ..........................................................................

(ii) තුන්වන චෝදනාව/අභියෝගය : ..........................................................................

**50.** සිසරෝගේ **මහලු විය** (On Old Age) කෘතියේ මහලු වියට එරෙහිව නැගෙන තුන්වන චෝදනාවට/අභියෝගයට මුහුණදීම පිළිබඳව සිසරෝ යෝජනා කරන ආකාරය කෙටියෙන් දක්වන්න.

..........................................................................................

..........................................................................................

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය II
கிரேக்க, உரோம நாகரிகம் II
Greek and Roman Civilization II

48 STE II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.

**Use additional reading time to go through the question paper, select the questions you will answer and decide which of them you will prioritise.**

**උපදෙස්:**

- පහත දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.
- **පළමුවන සහ හයවන ප්‍රශ්න අනිවාර්ය වේ.** ඊට අමතරව **I** කොටසේ **A** උප කොටසෙන් **එක්** ප්‍රශ්නයක් ද **B** උප කොටසෙන් **එක්** ප්‍රශ්නයක් ද **II** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන තවත් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
- **සියලු ම** ප්‍රශ්නවලට **එක් භාෂාවකින්** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස - ග්‍රීක හා රෝම ඉතිහාසය

**1.** පහත සඳහන් මාතෘකාවලින් **පහක්** තෝරාගෙන, එක් මාතෘකාවකට අවම වශයෙන් කරුණු **හතරක්වත්** අඩංගු කරමින්, ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) එෆෝර්වරු
(ii) මෙසේනියානු යුද්ධය
(iii) ප්ලැටියා සටන
(iv) පෝසානියාස්
(v) මහා ඇලෙක්සැන්ඩර්
(vi) නූමා පොම්පිලියස්
(vii) ඩෙකෙම්විරේටය
(viii) ගායස් ග්‍රැකස්
(ix) මුණ්ඩා සංග්‍රාමය
(x) මාර්ක් ඇන්ටනි

(ලකුණු 04 × 5 = 20යි)

### A උප කොටස - ග්‍රීක ඉතිහාසය

**2.** (i) ඔස්ට්‍රසිසම් ක්‍රමය යනු කුමක් ද? (ලකුණු 03 යි)

(ii) ක්ලයිස්තනීස්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයන් කෙටියෙන් දක්වන්න. (ලකුණු 05 යි)

(iii) සොලෝන් සහ ලයිකර්ගස්ගේ ප්‍රතිසංස්කරණ අදාළ රාජ්‍යයන් කෙරෙහි බලපෑ ආකාරය සුදුසු උදාහරණ සපයමින් සසඳන්න. (ලකුණු 07 යි)

**3.** (i) නිකියාස්ගේ සාමය යෝජනා කරන විට ගෙන ආ කොන්දේසි සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) නිකියාස්ගේ සාමය අසාර්ථක වීමට සහ පෙලොපොනීසියානු යුද්ධය නැවත ආරම්භ වීමට හේතු වූ කරුණු කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

(iii) පෙලොපොනීසියානු යුද්ධයේ දී ඇතන්ස් නගරයේ අසාර්ථකත්වයට සිසිලියානු ආක්‍රමණය බලපෑ අයුරු සුදුසු උදාහරණ සහිතව පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

## B උප කොටස - රෝම ඉතිහාසය

**4.** (i) පැට්‍රිෂියන්වරු යනු කවුරුන් ද? (ලකුණු 03 යි)

(ii) ප්ලෙබියානුවන්ගේ දුක්ගැනවිලි පිළිබඳව කෙටියෙන් දක්වන්න. (ලකුණු 05 යි)

(iii) ප්ලෙබියානුවන් ක්‍රමක්‍රමයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද දිනා ගනිමින් ඔවුන්ගේ සමාජ තත්ත්වය ඔවුන්ගේ ප්‍රතිවාදී සමාජ පංතියට සමානව ඉහළ නංවා ගත් ආකාරය අදාළ දේශපාලන සිද්ධීන් සහ නීති ඇසුරෙන් අගයන්න. (ලකුණු 07 යි)

**5.** (i) සෙන්සර් පදවිය හෙබ වූ කාලයේ දී කේටෝ රෝමයට ලබාදුන් සේවාවන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) ජුගුර්තානු යුද්ධයේ (ක්‍රි.පූ. 112-106) සිදුවීම් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iii) සුල්ලාගේ පරිපාලන ප්‍රතිසංස්කරණ සහ ඔහු රෝම සෙනට් සභාවේ බලය තහවුරු කළ ආකාරය ගැන සඳහන් කරමින් සුල්ලාගේ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි)

## II කොටස - ග්‍රීක හා රෝම සාහිත්‍යය

**6.** **ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයෙහි 6 (a) සිට 6 (g) තෙක්** වූ උද්ධෘත පාඨ අතුරෙන් **පහක්** තෝරාගෙන, ඒවායේ අවස්ථා සම්බන්ධය පෙන්වා, විෂය කරුණු පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ලකුණු 04 × 5 = 20යි)

**7.** (i) යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** නාට්‍යයේ, පිරිමි සේවකයාට අනුව ඇල්සෙස්ටිස් රැජිණගේ මරණය නිසා ඇඩ්මීටස්ගේ ගෘහයේ සේවය කරන සේවකයන්ට සිදු වූ පාඩුව කුමක්ද? (ලකුණු 03 යි)

(ii) යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** නාට්‍යයේ ඇඩ්මීටස් හා ෆෙරස් අතර ඇතිවුණ වාචික ගැටුම

(අ) ඇඩ්මීටස් තම තරුණ බිරිඳට මියයෑමට ඉඩහැරීම පිළිබඳව ෆෙරස්ට කළ චෝදනාවත්,

(ආ) එම චෝදනාවන්ගෙන් ෆෙරස් ගැළවුන ආකාරයත්, අවම වශයෙන් **එක්** උදාහරණයක්වත් කෘතියෙන් ගෙන දක්වමින් කෙටියෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 05 යි)

(iii) ඇඩ්මීටස් සහ ෆෙරස් අතර ඇති වූ වාචික ගැටුම නාට්‍යයේ සමස්ත බලපෑමට කෙසේ අදාළ වන්නේ දැයි යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** නාට්‍යය සම්බන්ධයෙන් තක්සේරු කරන්න. (ලකුණු 07 යි)

**8.** (i) ටෙරන්ස්ගේ **නැන්දම්මාවරු** නාට්‍යයේ,

(අ) ස්ත්‍රී දූෂණ සිද්ධිය පිළිබඳව පළමුවෙන් ම හෙළි කරන්නේ කවුද?

(ආ) කාට ද?

(ඉ) අවසානයේ දී දූෂකයා හඳුනා ගැනීමට හේතුවන කරුණු දක්වමින් ඒ පිළිබඳව දෙවනුව සඳහන් කරන්නේ කවුද? (ලකුණු 03 යි)

(ii) ටෙරන්ස්ගේ **නැන්දම්මාවරු** නාට්‍යයේ,

(අ) පැම්ෆීලස්ට තම බිරිඳ කෙරෙහි වූ ආකල්ප වෙනස් කිරීමට පෙළඹ වූ තත්ත්වයන් ඉතා කෙටියෙන් සඳහන් කරමින්

(ආ) එම අවස්ථාවේ පැම්ෆීලස්ට තම නිවසින් පිටව ඉම්බ්‍රොස් වෙත යන්නට සිදු වූ හේතුව දක්වන්න. (ලකුණු 05 යි)

(iii) සාමාන්‍ය සමාජ සිදුවීම්, කොටස් චරිත යොදාගෙන වේදිකාගත කරමින් ටෙරන්ස් රසවත් හා විනෝදාත්මක හාස්‍ය නාට්‍යයක් නිර්මාණය කර ඇති ආකාරය ඔහුගේ **නැන්දම්මාවරු** නාට්‍ය ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි)

**9.** (i) සිසරෝගේ **මහලු විය** කෘතියට අනුව, මහලු විය විඳ දරා ගැනීම සහ කළමනාකරණය කිරීම පිළිබඳව තම අදහස් දැක්වීමට කේටෝට ආරාධනා කරන පුද්ගලයන් **දෙදෙනා** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) සිසරෝගේ **මහලු විය** කෘතියේ විස්තර වන සිසරෝ සහ ඇටිකස් අතර පැවති මිත්‍රත්වය එම කෘතිය ඇසුරෙන් කෙටියෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 05 යි)

(iii) මහලු විය ආශ්‍රිතව එන සියලු අභියෝගවලට මුහුණ දෙමින් මහලු විය විඳදරා ගැනීම පිළිබඳව ඔහුගේ අදහස් ප්‍රකාශ කිරීමට සිසරෝ කෙතරම් දක්ෂ ලෙස කේටෝ තෝරාගෙන තිබේ ද යන්න සිසරෝගේ **මහලු විය** කෘතිය ඇසුරෙන් විවේචනාත්මකව තක්සේරු කරන්න. (ලකුණු 07 යි)

* * *

[3 වැනි පිටුව බලන්න/பக். 3 ஐப் பார்க்க/See page three